චක්‍රලේඛ අංක - LAE/2025 - 44

**TR - 07**

මගේ අංකය :- TR/LAE/2025/CIR
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2025.03.31

**සියළුම තේරීම්භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**<u>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06</u>**
**<u>ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස්රථ යොදා ගැනීම.</u>**

2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ලිපිද්‍රව්‍ය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඔබට අවශ්‍ය බස්රථ ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ වලට අමතරව පෞද්ගලික බස්රථ ද ලබාගැනීමට කටයුතු කළ හැකිය. ඔබගේ දිස්ත්‍රික්කයේ ඡන්ද පොළ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික බස්රථ ද යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඔබට අවශ්‍ය බස්රථ සංඛ්‍යාව ගණනය කර **<u>මීට අමුණා ඇති ලිපියේ සඳහන් දිස්ත්‍රික් නියෝජිතයා අමතා අවශ්‍ය බස්රථ ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කරන්න.</u>**

02. මේ සඳහා බස්රථ ලබාදිය හැකි මිල ගණන්, ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා ඇති අතර, එම මිල ගණන් පහත පරිදි වේ. එම ගාස්තු ප්‍රමාණයන් යටතේ ඡන්ද විමසීම නිමවීමෙන් පසු ඔබ ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

**දිස්ත්‍රික්කය තුළ ධාවනයේදී දිනකට ගෙවීම.**

| | ආසන 42 හෝ ඊට වැඩි (රුපියල්) | ආසන 30 සිට 40 දක්වා (රුපියල්) | ආසන 25 සිට 29 දක්වා (රුපියල්) |
|---|---|---|---|
| කි.මී. 50 දක්වා | 18,850.00 | 16,850.00 | 15,850.00 |
| කි.මී.51 සිට 75 දක්වා | 20,850.00 | 18,850.00 | 17,850.00 |
| කි.මී.76 සිට 100 දක්වා | 23,850.00 | 21,850.00 | 20,850.00 |
| කි.මී. 101 සිට 125 දක්වා | 26,850.00 | 24,850.00 | 23,850.00 |
| කි.මී. 125 ට වැඩිවන විට කි.මී. 1 කට | රු. 250.00 | රු. 200.00 | රු. 200.00 |

03. ඉහත ගෙවීම් වලට අමතරව රියදුරු සඳහා වූ ගෙවීමක් ලෙස දිනකට රු.900/- ක මුදලක් ගෙවිය යුතුය. රිය සහායකවරයෙකු සිටී නම් ඔහු වෙනුවෙන් ද දිනකට රු.900/- ක මුදලක් ගෙවිය හැකිය. මෙම බස්රථ ඡන්ද විමසීමේ දිනයට පෙරදින (එනම් 2025.05.05 දින) උදෑසන නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත කැඳවීම ප්‍රමාණවත් වන අතර, ඒ අනුව දින දෙකකට මෙම ගෙවීම කළ හැකිය.

04. ඉහත ලබා ගන්නා බස්රථ ධාවන තත්වය පිළිබඳව තහවුරුවක් ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂකවරයා වෙත රථය යොමු කිරීමට කටයුතු කළ හැකිය.

05. තවද ඡන්ද පෙට්ටි නිකුත් කරන දින පෞද්ගලික බස්රථ අදාළ කාර්යයන් සඳහා යෙදවීමේදී මෙම බස්රථ එක් එක් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත් කර හැරීමට ප්‍රථම අදාළ ඡන්ද මධ්‍යස්ථානයට යා යුතු ගමන් මාර්ගය පිළිබඳව මාර්ග සටහනක් බස්රථයේ රියදුරු මහතා වෙත ලබාදීමට කටයුතු කරන්න.

06. මෙම ප්‍රවාහන වැඩපිළිවෙල සංවිධානය කර ගැනීමේදී මේ සමග අමුණා ඇති ලැයිස්තුවේ සඳහන් ඔබ දිස්ත්‍රික්කයට අදාළ නියෝජිතයා අමතා ඔහුගේ සහාය ඔබට ලබා ගත හැකිය. ඔහුගේ ජංගම දුරකථන අංකයෙන් ඔහු සම්බන්ධ කර ගැනීමට අපහසුතාවයක් ඇති වුවහොත් සංගමයේ සභාපති ගැමුණු විජේරත්න මහතාගේ ජංගම දුරකථන අංකය වන 077-7783255 අංකයට අමතන්න.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත් :- 1. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
2. විගණකාධිපති
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී

} කාරුණික දැන ගැනීම පිණිස

5. ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. ගැමුණු විජේරත්න මහතා,
සභාපති,
ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය.

} කල්වේලා ඇතිව ඔබගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නියෝජිතයන් දැනුම්වත් කිරීමට කරුණාකර පියවර ගන්න.

ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය.
නො.06,
නාවල පාර,
නුගේගොඩ.

දුරකථන අංක : 011-2822459
ෆැක්ස් අංක : 011-2825947

## ලංකා පෞද්ගලික බස්හිමියන්ගේ සංගමයේ දිස්ත්‍රික් බස් නියෝජිතයින්,

ලංකා පෞද්ගලික බස් නියෝජිතයින් පහතින් දැක්වේ. ඔවුන්ව සම්බන්ධීකරණය කරගැනීමේ දී යම් ගැටළුවක් වුවහොත් සංගමයේ ප්‍රධාන කාර්යාලයට, පහත දුරකථන අංකයට දැනුම් දෙන්න. **(0777783255 - ගැමුණු විජේරත්න මහතා)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | නම | දු.ක.අංකය |
|---|---|---|---|
| 1 | කොළඹ | ගැමුණු විජේරත්න මහතා | 0777783255 |
| 2 | ගම්පහ | ඩී.මිල්ටන් පෙරේරා මහතා | 0777613774 |
| 3 | කළුතර | නිමල් ජයලත් මහතා | 0716846195 |
| 4 | කෑගල්ල | රුවන් චමිල මහතා | 0716372447 |
| 5 | රත්නපුරය | ජේ.එම්.ජයවීර මහතා | 0757274812 |
| 6 | මාතර | ඒ.රණවක මහතා | 0718116522 |
| 7 | ගාල්ල | සභාපති ගැමුණු විජේරත්න මහතා සම්බන්ධ කර ගන්න | |
| 8 | හම්බන්තොට | ඩී.එස්.එස්.ගුණවර්ධන මහතා | 0779003792 |
| 9 | අනුරාධපුරය | ඩී.අජන්ත මහතා | 0716558658 |
| 10 | පොලොන්නරුව | රොෂාන් ගාල්ලගේ මහතා | 0778754108 |
| 11 | මහනුවර | සරත් මහානාම මහතා | 0757371064 |
| 12 | මාතලේ | සභාපති ගැමුණු විජේරත්න මහතා සම්බන්ධ කර ගන්න | |
| 13 | නුවරඑළිය | බී.සේනාරත්න මහතා | 0778131903 |
| 14 | බදුල්ල | සභාපති ගැමුණු විජේරත්න මහතා සම්බන්ධ කර ගන්න | |
| 15 | මොණරාගල | එච්.පී.සාගර මහතා | 0774962517 |
| 16 | ත්‍රිකුණාමලය | ජී.ජී.විමලසේන මහතා | 0662270028 |
| 17 | අම්පාර | එච්.ඩී.ගුණදාස මහතා | 0773037414 |
| 18 | මඩකලපුව | එස්.ඩී.එම්.එස්.ඒ.මවුලානා මහතා | 0773672159 |
| 19 | පුත්තලම | එම්.එස්.මොහමඩ් රාමු මහතා | 0767114579 |
| 20 | කුරුණෑගල | එම්.ඩී.ජේ.සේනාධීර මහතා | 0777179631 |
| 21 | යාපනය | පී. ගන්ගාදරම් මහතා | 0778150050 |
| 22 | මන්නාරම | | |
| 23 | වවුනියාව | | |
| 24 | කිළිනොච්චිය | | |
| 25 | මුලතිව් | | |